# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2017 අංක 28 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

---

[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 17 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---


2017 නොවැම්බර් මස 17 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ : රු. 5.00 යි.** **තැපැල් ගාස්තුව : රු. 10.00 යි.**

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2017 අංක 28 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 2017 නොවැම්බර් මස 17 වන දින]

එල්. ඩී. — ඕ. 1/2017.

**අනපේක්ෂිත සහ හදිසි අවස්ථාගත කරුණු හේතුකොට ගෙන ඡන්ද විමසීම් පැවැත්වීම කල් තබනු ලැබූ උතුරු පළාතේ ප්‍රාදේශීය සභා දෙකක් සම්බන්ධයෙන් අලුතින් නාමයෝජනා කැඳවීම සඳහා සහ ඡන්ද විමසීම් පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීම සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම සඳහා වූ පනතකි**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ උතුරු පළාතේ පුදුකුඩිඉරිප්පු සහ මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාවල මැතිවරණ සම්බන්ධයෙන් නාමයෝජනා භාරගනු ලබන බවට දැන්වීම් පළ කර ඇති හෙයින් ද: පූර්විකාව.

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද නියෝග මගින් ඉහත සඳහන් ප්‍රාදේශීය සභා සඳහා ස්ථිර කරගත් ඡන්ද විමසීමේ දින, අනපේක්ෂිත සහ හදිසි අවස්ථාගත කරුණු හේතුවෙන් කලින් කලට කල් දමනු ලැබූ හෙයින් ද:

එකී නාමයෝජනා භාර දුන් තැනැත්තන් මියයාම හෝ අවතැන්වීම හෝ සිය පක්ෂ වෙනස් කිරීම හෝ නාමයෝජනා භාරදුන් තැනැත්තන් සැළකිය යුතු සංඛ්‍යාවක් විදේශගතවීම යන කරුණු හේතුවෙන් හෝ යථෝක්ත නාමයෝජනා කැඳවනු ලැබූ අවස්ථාවේ දී වයස අවුරුදු තිස් පහට අඩු විය යුතු ව තිබූ අපේක්ෂකයින් වයස අවුරුදු තිස්පහ ඉක්මවා ඇති හෙයින්, ඉහත සඳහන් ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අලුත් නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීම අවශ්‍ය වී ඇති හෙයින් ද:

එකී ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් නාමයෝජනා භාරදීමේ සිට ඉකුත්ව ඇති කාලපරිච්ඡේදය හේතුවෙන් එම ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අලුතෙන් නාමයෝජනා කැඳවීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද සහ ඉහත සඳහන් ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් අලුතෙන් ඡන්ද පැවැත්වීම සඳහා විධිවිධාන සැලැස්වීමට ද අවශ්‍යව ඇති හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

2—PL 010386 -2862 (2017/10)

ලුහුඬු නාමය.

1. මේ පනත 2017 අංක 28 දරන පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ඇතැම් සභා සඳහා ඡන්ද විමසීම් සම්බන්ධයෙන් නාමයෝජනා සහ තැන්පතුවලට අදාළ විධිවිධාන.

2. (1) (මෙහි මින්මතු "ආඥාපනත" යනුවෙන් සඳහන් කරනු ලබන) (262 වන අධිකාරය වූ ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 26 වන වගන්තිය යටතේ පළකරන ලද දැන්වීම් ප්‍රකාරව මෙහි උපලේඛනයේ සඳහන් ප්‍රාදේශීය සභා සඳහා වන ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ආඥාපනතේ 28 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද නාමයෝජනා පත්‍ර, කිසිවිටෙකත් ඉදිරිපත් කරනු නොලැබුවාක් මෙන් වලංගු නොවන හා බලාත්මක නොවන ලෙස මෙයින් සලකනු ලැබේ.

(2) උපලේඛනයේ සඳහන් ප්‍රාදේශීය සභා සඳහා වන ඡන්ද විමසීම් සම්බන්ධයෙන්, ආඥාපනතේ 38 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පළකරන ලද දැන්වීම් මෙයින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබේ.

(3) ආඥාපනතේ 30 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, උපලේඛනයේ සඳහන් ප්‍රාදේශීය සභාවල මැතිවරණ සඳහා ස්වාධීන කණ්ඩායමක් විසින් නම් කරන ලද අපේක්ෂකයන් සම්බන්ධයෙන් ආඥාපනතේ 29 වන වගන්තිය යටතේ කරන ලද තැන්පතු, ආපසු ලබාගැනීම සඳහා ආඥාපනතේ 29 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ලදුපත, එම තැන්පතුවක් තැබූ තැනැත්තා විසින් ඉදිරිපත් කිරීමේ දී, එකී තැන්පතුව කළ දින සිට මුදල් නැවත ගෙවනු ලබන දිනය දක්වා වූ කාලයට වර්ෂයකට සියයට දොළහක පොළී අනුපාතයකට ඒ තැන්පත් කළ මුදල, ඒ තැනැත්තා වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

ඡන්ද පැවැත්වීම සඳහා ආරම්භ කළ යුතු පියවර.

3. 2012 අංක 22 දරන පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ 82 වන වගන්තියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මෙහි උපලේඛනයේ සඳහන් ප්‍රාදේශීය සභා සඳහා මැතිවරණ පැවැත්වීමට ආඥාපනත යටතේ පියවර ආරම්භ කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ආඥාපනතට අනුකූලව, නාමයෝජනා පිළිබඳ දැන්වීම මැතිවරණ කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නියමයක් මගින් නිශ්චය කරනු ලැබිය හැකි දිනයක දී, පළ කළ යුතු අතර, එකී දිනය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයේ සිට මාස හයකට පසු දිනයක් නොවිය යුතු ය.

**4.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

උපලේඛනය

(2 වන සහ 3 වන වගන්ති)

1. පුදුකුඩිඉරිප්පු ප්‍රාදේශීය සභාව; සහ
2. මුහුදුබඩපත්තු ප්‍රාදේශීය සභාව.